# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2009 අංක 28 දරන වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම (සන්නද්ධ හමුදා) (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 මැයි මස 18 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 මැයි මස 22 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක්
වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 6.00 යි.		තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

## 2009 අංක 28 දරන වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම (සන්නද්ධ හමුදා) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 මැයි මස 18 වන දින]

එල්. ඩී.—ඕ. 56/2007.

### 1998 අංක 60 දරන වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම (සන්නද්ධ හමුදා) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2009 අංක 28 දරන වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම (සන්නද්ධ හමුදා) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1998 අංක 60 දරන වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම (සන්නද්ධ හමුදා) පනතේ 4 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් එකී පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — 1998 අංක 60 දරන පනතට අලුතින් 4අ වගන්තිය ඇතුළත් කිරීම.

"3 වන සහ 4 වන වගන්තිවල කාර්යය සඳහා "සන්නද්ධ හමුදාවල සාමාජිකාවක්" යන්නෙහි අර්ථය.

4අ. මේ පනතේ 3 වන සහ 4 වන වගන්තිවල කාර්යය සඳහා "සන්නද්ධ හමුදාවල සාමාජිකාවක්" යන්නෙන් —

(අ) කාන්තාවක් වන්නා වූ, ශ්‍රී ලංකා යුධ හමුදාවේ නිත්‍ය බලකායේ නිලධාරිනියක් හෝ සෙබළියක් ; හෝ

(ආ) කාන්තාවක් වන්නා වූ, අවස්ථාවෝචිත පරිදි රාජකීය ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය නාවික බලකායේ නිලධාරිනියක හෝ නාවික සෙබළියක ; හෝ

(ඇ) කාන්තාවක් වන්නා වූ, අවස්ථාවෝචිත පරිදි රාජකීය ලංකා ගුවන් හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිත්‍ය ගුවන් බලකායේ නිලධාරිනියක හෝ ගුවන් සෙබළියක ;

අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ අලුතින් 4ආ, 4ඇ, 4ඇ, 4ඉ සහ 4ඊ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එම ප්‍රඥප්තියේ 4ආ, 4ඇ, 4ඇ, 4ඉ සහ 4ඊ වගන්ති ලෙස බලාත්මක විය යුතුය:—

"සන්නද්ධ හමුදාවල නිත්‍ය උපසේවා, ස්වේච්ඡා හෝ ස්වේච්ඡා උපසේවා බලකායේ සාමාජිකාවන්ට විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ව්‍යාප්ත කිරීම.

4ආ. (1) සන්නද්ධ හමුදාවල ස්වේච්ඡා බලකායේ සාමාජිකාවක වී සිටි සහ මේ වගන්තිය ක්‍රියාත්මක වීමට පෙරාතුව වූ දිනයක දී විශ්‍රාම ප්‍රතිලාභ සහිතව විශ්‍රාම ගත් යම් තැනැත්තකු හෝ එවැනි සාමාජිකාවක ලෙස එම දිනයේ දී එම බලකායේ දිගටම සිටින යම් තැනැත්තකු ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයකට පෙර තත්කාර්යය සඳහා ඉල්ලීමක් කිරීමේ දී විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායිකාවක වීමට කැමැත්ත ප්‍රකාශ කළ හැකි ය.

(2) සන්නද්ධ හමුදාවල අවස්ථාවෝචිත පරිදි නිත්‍ය බලකායෙන් හෝ ස්වේච්ඡා බලකායෙන් විශ්‍රාම යාමෙන් පසු හෝ ඇය මුදා හැරීමෙන් පසු, යම් තැනැත්තියක් මේ වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීමේ දිනයට පෙර සන්නද්ධ හමුදාවල, අවස්ථාවෝචිත පරිදි, නිත්‍ය උපසේවා බලකායට හෝ ස්වේච්ඡා උපසේවා බලකායට මාරු කරනු ලැබ, විශ්‍රාම ප්‍රතිලාභ සහිතව විශ්‍රාම ගිය හෝ එම දිනයේ දී එවැනි සාමාජිකාවක ලෙස එවැනි උපසේවා බලකායක දිගටම සිටින යම් තැනැත්තියකට ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයකට පෙර ඉල්ලීමක් කරමින් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායිකාවක වීමට කැමැත්ත ප්‍රකාශ කළ හැකි ය.

(3) (1) සහ (2) වන උපවගන්තිවල විධිවිධාන නොතකා, (1) උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ කැමැත්ත ප්‍රකාශ කිරීමකින් තොරව නියමිත දිනයට පෙර එකී උපවගන්තිවල නිශ්චිතව දැක්වෙන

සාමාජිකාවක මිය යන අවස්ථාවක ඇය ස්වාමිපුරුෂයකු හෝ ළමයකු නැතහොත් ස්වාමිපුරුෂයකු සහ ළමයකු හෝ ස්වාමිපුරුෂයකු සහ ළමයින් ජීවත්ව සිටිය දී මිය ගියේ නම් ඇය විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වීමට කැමැත්ත ප්‍රකාශ කොට ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායකයකු වීමට කැමැත්ත ප්‍රකාශ කරනු ලබන තැනැත්තියක් හෝ, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායකයකු වීමට කැමැත්ත ප්‍රකාශ කොට ඇති ලෙස සලකනු ලබන තැනැත්තියක් සම්බන්ධයෙන් වන විට, එකී මිය ගිය තැනැත්තියගේ කටයුතු පරිපාලනය කරනු ලබන තැනැත්තා හෝ විසින්, එම තැනැත්තිය අදාළ සන්නද්ධ හමුදාවට බැඳුන දිනයෙන් ආරම්භ වී අවස්ථාවෝචිත පරිදි ඇය කැමැත්ත ප්‍රකාශ කළ, විශ්‍රාම ගිය, හෝ මිය ගිය දිනය දක්වා වූ කාල සීමාව සඳහා සියලු හිඟ දායක මුදල්, එකී මුදල් මත වර්ෂයකට සියයට හතරේ අනුපාතයට වූ පොලිය ද සමග විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ගෙවනු ලැබිය යුතු ය.

(5) (1) හෝ (2) උපවගන්තිවල විධිවිධාන යටතේ කරන ලද කැමැත්ත ප්‍රකාශ කිරීමක් අවසානාත්මක විය යුතු ය.

මේ වගන්තිය ක්‍රියාත්මක වීමෙන් පසු සන්නද්ධ හමුදාවල සාමාජිකාවක වන තැනැත්තියක, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායිකාවක වන බව.

4ඇ. මේ වගන්තිය යටතේ විධිවිධාන ක්‍රියාත්මක වන දිනයේ දී හෝ ඉන්පසුව සන්නද්ධ හමුදාවල නිත්‍ය උපසේවා බලකායේ හෝ ස්වේච්ඡා බලකායේ හෝ ස්වේච්ඡා උපසේවා බලකායේ සාමාජිකාවක වන යම් තැනැත්තියක එම දිනයේ සිට සහ ඉන්පසුව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායිකාවක වන්නේය.

මේ පනත යටතේ වූ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හැර වෙනත් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයකට හිමිකම් කීම.

4ඇ. සන්නද්ධ හමුදාවල සාමාජිකාවක්, ඇය සන්නද්ධ හමුදාවලට බැඳීමට පෙර හෝ සන්නද්ධ හමුදාව හැර යාමෙන් පසු රාජ්‍ය සේවයේ යම් තනතුරක සේවයේ නියුක්තව සිට ඇති අවස්ථාවක, සන්නද්ධ හමුදාවල සාමාජිකාවක් ලෙස හිමි වන විශ්‍රාම වැටුපට අමතරව එම අනෙක් රැකියාව ප්‍රකාරව විශ්‍රාම වැටුපක් ලැබීමට ඇයට හිමිකම් ඇති අතර ඇය මිය ගියහොත් —

(අ) ඇය සන්නද්ධ හමුදාවල සම්පූර්ණ සේවා කාලය සේවය කළේ නම්, ඇයට ලැබෙන සම්පූර්ණ විශ්‍රාම වැටුපට වැඩිනොවන මුදලක් ; හෝ

(ආ) ඇය රාජ්‍ය සේවයේ සම්පූර්ණ සේවා කාලය සේවය කළේ නම්, ඇයට ලැබෙන සම්පූර්ණ විශ්‍රාම වැටුපට වැඩි නොවන මුදලක්

ඇගේ වැන්දඹු පුරුෂයාට සහ අනත්දරුවන්ට විශ්‍රාම වැටුපක් ලෙස ලබා ගැනීමට හිමිකම් ඇත.

ක්‍රියාන්විත රාජකාරියේ දී යෙදී සිටිය දී සිදු වූ තුවාල හේතුවෙන් ආබාධිත වූ සන්නද්ධ හමුදාවේ සාමාජිකාවක් හට විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ව්‍යාප්ත කිරීම.

4ඉ. (1) ක්‍රියාන්විත රාජකාරි හෝ වෙනත් යම් නීතිය ක්‍රියාවේ යෙදවීමේ රාජකාරි ඉටු කරන අතරතුර හෝ ත්‍රස්තවාදී ක්‍රියාවල ප්‍රතිඵලයක් වශයෙන් සිදු වූ තුවාල හේතුකොට ගෙන හෝ ආබාධිත වී ඇති සහ අවස්ථාවෝචිත පරිදි ශ්‍රී ලංකා යුද හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වෛද්‍ය මණ්ඩල විසින් යුධ සේවය සඳහා නුසුදුසු බවට තීරණය කරනු ලැබ ඇත්තා වූ ද, වයස අවුරුදු 55 එළඹෙන තුරු වැටුපක් සහ දීමනා ලබන්නා වූ ද —

(අ) ශ්‍රී ලංකා යුද හමුදාවේ නිත්‍ය බලකායේ, නිත්‍ය උපසේවා බලකායේ, ස්වේච්ඡා බලකායේ හෝ ස්වේච්ඡා උපසේවා බලකායේ කාන්තා නිලධාරිනියක් හෝ කාන්තා සෙබළියක් විසින් ; හෝ

(ආ) ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායේ, නිත්‍ය උපසේවා බලකායේ, ස්වේච්ඡා බලකායේ හෝ ස්වේච්ඡා උපසේවා බලකායේ කාන්තා නිලධාරිනියක් හෝ කාන්තා සෙබළියක් විසින් ; හෝ

(ඇ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිත්‍ය බලකායේ නිත්‍ය උපසේවා බලකායේ, ස්වේච්ඡා බලකායේ හෝ ස්වේච්ඡා උපසේවා බලකායේ යම් කාන්තා නිලධාරිනියක් හෝ කාන්තා සෙබළියක් විසින්,

අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයකට පෙර, තත්කාර්යය සඳහා කරනු ලබන ඉල්ලීමක් මගින් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායිකාවක වීමට කැමැත්ත ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) (1) උපවගන්තියේ සඳහන් තැනැත්තියක එම උපවගන්තිය යටතේ කැමැත්ත ප්‍රකාශ කිරීමකින් තොරව නියමිත දිනයට පෙර මියයන අවස්ථාවක කලත්‍රයකු හෝ ළමයකු නැතහොත් කලත්‍රයා සහ ළමයකු හෝ කලත්‍රයා සහ ළමයින් ජීවත්ව සිටියදී මිය ගියහොත් ඇය විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායකවීමට කැමැත්ත ප්‍රකාශ කොට ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) (4) ආ වගන්තියේ (4) සහ (5) වන උපවගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මේ වගන්තියේ සඳහන් තැනැත්තකුට අදාළ විය යුතු ය.

අර්ථ නිරූපණය.

4ඊ. 4ආ, 4ඇ සහ 4ඈ වගන්තිවල කාර්ය සඳහා "සන්නද්ධ හමුදාවල නිත්‍ය උපසේවා බලකායේ, ස්වේච්ඡා බලකායේ හෝ ස්වේච්ඡා උපසේවා බලකායේ සාමාජිකාවක්"—

(අ) ශ්‍රී ලංකා යුද හමුදාව සම්බන්ධයෙන් වන විට, යුද හමුදා පනතේ 3 වන වගන්තියේ

(3) වන උපවගන්තිය යටතේ නිත්‍ය බලකායේ අවස්ථාවෝචිත පරිදි කාන්තා නිලධාරිනියක් හෝ කාන්තා සෙබළියක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ආ) ශ්‍රී ලංකා නාවික හමුදාව සම්බන්ධයෙන් වන විට, නාවික හමුදා පනතේ 3 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ නිත්‍ය නාවික බලකායේ අවස්ථාවෝචිත පරිදි, කාන්තා නිලධාරිනියක් හෝ කාන්තා සෙබළියක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) ශ්‍රී ලංකා ගුවන් හමුදාව සම්බන්ධයෙන් වන විට, ශ්‍රී ලංකා ගුවන් හමුදා පනතේ 3 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ නිත්‍ය ගුවන් හමුදා බලකායේ අවස්ථාවෝචිත පරිදි කාන්තා නිලධාරිනියක් හෝ කාන්තා සෙබළියක් ලෙස සලකනු ලැබිය යුතු ය.”.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.